# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2082/59 - 2018 අගෝස්තු මස 03 වැනි සිකුරාදා - 2018.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1925/59 හා 2015.07.29 දිනැති සහ අංක 1996/25 හා 2016.12.06 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත, අංක 1877/27 හා 2014.08.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට පහත සංශෝධනයන් ඇතුළත් කරනු ලැබේ.

**7.3.3.1 ලිඛිත විභාගය**

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 03 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

*සටහන* - බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය සියළුම දෙපාර්තමේන්තු සඳහා පොදු ප්‍රශ්න පත්‍රයක් විය යුතු අතර, විෂයානුබද්ධ දැනුම ප්‍රශ්න පත්‍රය ඒ ඒ දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් විෂය නිර්දේශය අනුව සකස් කළ ප්‍රශ්න පත්‍රයක් විය යුතු ය. විභාගය පවත්වනු ලබන්නේ විභාග දෙපාර්තමේන්තුව මඟිනි.

**11. තනතුරුවලට පත් කිරීම**

*11.2 තෝරා ගනු ලබන ක්‍රමය :* ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් 1 ශ්‍රේණියේ තනතුරුවලට තෝරා ගනු ලබයි. එක් එක්. දෙපාර්තමේන්තුවල තනතුරුවලට පත් කිරීමට සපුරාලිය යුතු සුදුසුකම් අදාළ බඳවා ගැනීම් පටිපාටිවල ඇතුළත් කළ යුතු යි.

*සටහන* - රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය සඳහා ලකුණු ලබා දීමේ පටිපාටිය අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී ප්‍රසිද්ධ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 ජූලි මස 19 වැනි දින,
අංක 1200/9,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී ය.

08 - 650


1A - G 28219 — 17 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*